# දඹුලු විහාරයේ බෞද්ධ උරුමය සංරක්ෂණ ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

ගම්මහේගේ වැව අමිත හිමි[1]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෙන් විහාර අතරින් රංගිරි දඹුලු ලෙන් විහාරයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඓතිහාසික අවධි කිහිපයක් තුළ ගොඩනැගුණු මෙම ආරාම සංකීර්ණය බෞද්ධ උරුමයෙන් පෝෂිත පුදබිමක්වශයෙන් හැඳින්විය හැකිය. මෙහි දක්නට ලැබෙන සිතුවම් අලංකාර කලාගාරයක් සිහිලක්වයි.ඒ නිසාම දූනට ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. මෙම බෞද්ධ උරුමය ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට පමණක් නොව සමස්ථ ලෝකවාසි බෞද්ධ අබෞද්ධ සිලුදෙනාටම අයිති දායාදක් බවට පත්ව ඇත. වර්තමානය වන විට මෙහි පවතින උරුමයන් යම් තර්ජනයකට ලක්වී ඇති බව දක්නට ලැබේ. අප එම උරුමයන් නිවැරදිව හඳුනාගෙන එය සුරක්ෂිත කොට මතු පරපුරට දායාද කළ යුතුය.

## පර්යේෂණ ගැටලුව

ඓතිහාසික රංගිරි දඹුලු ලෙන් විහාරය බෞද්ධ උරුමයෙන් පරිපූර්ණ වූ හොවා පුදබිමකි. එම උරුමය හඳුනාගැනීම වැදගත්ය. එසේම වර්තමානය වනවිට හායනය වීමට බලපාන ලබන සාධක මොනවාද එය අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද යන්න සොයා බැලීම වැදගත්ය.ඒ සඳහා වගකිය යුතු ආයතන නෛතික වශයෙන් කෙතෙක් දුරට මැදිහත් විය යුතු ද යන්න විමසා බැලිය යුතුය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සඳහා සමාජවිද්‍යා අධ්‍යයනවලදී යොදාගනු ලබන දත්ත රැස්කිරීමේ විධික්‍රම කිහිපයක් භාවිත කරන ලදී. මෙහිදී ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා පළමුවෙන්ම සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. උරුමය අධ්‍යයනය සඳහා භාවිතා කරණ නිරීක්ෂණය, සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, කේවල අධ්‍යයන ආදී විධික්‍රම යොදා ගන්නා ලදී.

[1] උපාධි අපේක්ෂක, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
gammahegewewaamitha@gmail.com

අරමුණ

මෙම අධ්‍යයනයේ අරමුණවන්නේ දඹුලු පුදබිම ආශ්‍රිත උරුමය අධ්‍යයනය කොට එය නිවැරදිව හඳුනාගෙන එහි දක්නට ලැබෙනඅගය මානව ප්‍රජාවටම පෙන්වා දී ආරක්ෂා කර ගැනීමටය.ඒ සඳහා ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ සොයා බැලීමට මෙන්ම වර්තමානය වනවිට උරුමය ආරක්ෂා කර ගැනීමට කුමණ ආකාරයෙන් මැදිහත් විය යුතුද? යන්න සොයා බලා එම උරුමය සමාජගත කිරිමට අපේක්ෂිතය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ඓතිහාසික රංගිරි දඹුලු විහාරය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේය. මුහුදු මට්ටමෙන් අඩි 1118 උසින් හා එම ප්‍රදේශයේ තැනිතාලාවේ සිට මීටර් 160ක් පමණ උස් පර්වතයක පිහිටා ඇත. කොළඹ සිට කිලෝමීටර් 148ක් ඊසාන දෙසින් ද නුවර සිට කිලෝමීටර් 72ක් උතුරින් ද පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ විශාලාතම ලෙන් විහාර සංකීර්ණය ලෙසද සැළකේ. උරුමයන් රැසකට මධ්‍යගතව පිහිටා ඇත. ප්‍රග් ඓතිහාසික සාධක හමුවන ඉබ්බන්කටුව සුසාන භූමිය දකුණු ආසියාවේ විශාලතම රෝසතිරුවාන කන්දවන නාමල් උයන ලෝක උරුමයක් වන සීගිරිය ආදි උරුමයන් රැසක් දක්නට ලැබෙන භූමියක මෙම ඓතිහාසික ලෙන් විහාරය පිහිටා ඇත.

වළගම්බා රජු විසින් මෙම විහාරය කරවූ බව රාජරත්නාකරයේ හා එම විහාරයේ තල්පත්වල සඳහන් වේ. ක්‍රි.ව 1187 - 1196 සමයේ දී නිශ්ශංකමල්ල රජු එම විහාරය ප්‍රතිසංස්කරණය කොට ප්‍රතිමාවල රන් ආලේපය කර ඇත. එම හේතුව නිසා රංගිරි දඹුලු විහාරය ලෙස නම් කොට ඇති නමුත් සේනරත් පරණවිතාන මහාතා කියා සිටින්නේ විශ්වගිර, යාවකොළ, ජබකොළ, ජබෝල පසු කාලයේ දී දඹුල්ල වූ බවයි. නිශ්ශංකපල්ල රජුට පසුව මෙම විහාරය ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ප්‍රතිසංස්කරණය කොට ඇත.

දඹුලු විහාරයේ බෞද්ධ උරුමයන් පිළිබඳ ගවේෂණය කොට බැලීමේ දී සංස්කෘතික උරුමයන් ස්වභාවික උරුමයන් හා ජීවමාන උරුමයන් හඳුනා ගත හැකිය. ඒ අනුව එම උරුමයන් මොනවාද කියා හඳුනා ගැනීම මගින් නිවැරදිව අධ්‍යයනය කිරිමට හා ඒ හරහා සමාජගත කොට ආරක්ෂා කරලීමට උපකාරි වේ. එම භූමිය තුළ දක්නට ලැබේන බෞද්ධ උරුමය ලෙස බිතුසිතුවම්, ප්‍රතිමා, අභිලේඛන, ආගමික වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි සංස්කෘතික උරුමය පෙන්වා දිය හැකිය. මෙහි සුවිශේෂිතම බෞද්ධ උරුමය බවට පත්වන්නේ අනුරාධපුර

යුගයේ සිට මහනුවර යුගයන් නියෝජනය කරණු ලබන බිතුසිතුවම්ය. එම සිතුවම් විවිධ ප්‍රමාණයේ ලෙන් 05ක් පුරා විසිරි පවති.

දඹුලු විහාරය ප්‍රසිද්ධික් උසුලනු ලබන්නේ දෙව්රජ විමාරයේ දක්නට ලැබෙන්නේ පිරිනිවන් මංචකය ලෙස හැඳින්වෙන සුවිශාල බුද්ධප්‍රතිමාව නිසාවේනි. විහාර භූමියේ ඇති ලෙන් පහ තුළම ප්‍රතිමාවන් දැකගත හැකිය. ඒවා නිර්මාණ මාධ්‍ය අනුව කොටස් තුනකට බෙදිය හැකිය. ශෛලමය ප්‍රතිමා, දැවමය ප්‍රතිමා, මැටිමය ප්‍රතිමා, වශයෙනි. එම ප්‍රතිමා අතර බුද්ධ ප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමා, දේව ප්‍රතිමා, රජවරුන්ගේ ප්‍රතිමා, දැකගත හැකිය. මෙවැනි ප්‍රතිමා 153ක් පමණ දක්නට ඇත.

මෙම විහාරාමය පබ්බත විහාරාම ගණනයට අයත්වන ආරාම සංකීර්ණයකි. අභිලේඛන 35ක් පමණ දක්නට ඇත. මෙම ශිලාලේඛනයන්බ්‍රාහ්මී අක්ෂරවලින් දක්වාඇත. එම ගණයට නොවැටෙන එකම ශිලාලේඛනය වන්නේ කිර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ සුප්‍රසිද්ධ දඹුලු පර්වත ලිපියයි. මෙම ලිපි අතරින් තුනකම රජවරුන් පිළිබඳව සඳහන් කරයි.අනෙක් ලිපි මගින් ආරාම පූජාවන් සම්බන්ධව කරුණු දක්වයි. ඒ අනුව උරුමක් ලෙස රැකගත යුතු අංගයක් ලෙස මෙම අභිලේඛන සඳහන් කළ හැකිය.

බෞද්ධ උරුමයන්ලෙස ආගමික ගොඩනැගිලි හඳුන්වා දීමට හැකිය. එම ගොඩනැගිලි වශයෙන් ස්තූපය, බෝධිඝරය, පිළිමගෙය, උපෝසථඝරය හඳුන්වා දිය හැකිය. විහාරයට අයත් ඇතුළු මළුවේ ගිනිකොන දෙසට වන්නට පිහිටා ඇති ස්තූපය වඩාත් ප්‍රසිද්ධ වී ඇත්තේ සෝමාවති ස්තූපය නමිනි. සෝමාවතිය බිසවගේ ආභරණ තැන්පත් කොට ගොඩනාගා ඇති බව සඳහන් කරයි. ක්‍රි:ව 5,6 සියවස්වල මෙය නිර්මාණය කොට ඇති අතර ක්‍රි:ව 8,9,10 සියවස්වල ප්‍රතිසංස්කරණය කොට ඇත. මීට අමතරව බෝධිඝරය පිළිමගේ හා උපෝසථඝරය ද ඉතා වැදගත් පුරාවිද්‍යා උරුමයන්ය. මෙම වස්තුවිද්‍යාත්මක උරුමයන් කැණීම් මගින් තහාවුරු කරගෙන ඇත.

සංස්කෘතික උරුමන්වලට අමතරව විහාරාමය ආශ්‍රිත ස්වභාවික උරුමයන් ද හඳුනා ගත හැකිය. තවමත් කැණීමට ලක්කොට නොමැති ලෙන් හා ස්වභාවික පරිසරය මෙන්ම බෞද්ධ උරුමය සමඟ බද්ධ වූ ජීවමාන උරුමයන් රැසක් හඳුනා ගත හැකිය. වාර්ෂික පවත්වන අලුත් සහාල් මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, නානුමුර මංගල්‍යය, වැනිඋරුමන් ඒ අතර ප්‍රධාන වේ. මෙම උරුමයන් ශීඝ්‍රයෙන් පරිහානියට පත්වෙමින් ඇති බව දැක ගත හැකිය. ඒ සඳහා බලපාන උරුම සංරක්ෂණ ගැටලු රාසියක් හඳුනාගත හැක.

- ➢ නෛතික දුර්වලතා
- ➢ නරඹන්නා කළමනාකරණය නොකිරිම
- ➢ සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම්
- ➢ දේශපාලනික,ආගමික හා සමාජීය බලපෑම්
- ➢ අනවබෝධය හා නොසැලකිල්ල
- ➢ මානව හා සත්ව පලිබෝධනය
- ➢ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

උරුමය පරිහානිය සඳහා බලපා ඇති ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත්තේ නෛතිකමය දුර්වලතාවයන්ය. ශ්‍රී ලංකාව තුළ ලෝක උරුමය ස්ථාන 06 ක් පැවැතිය ද ඒ සඳහා අවශ්‍ය විධිමත් නීති අඩංගු පරිච්ඡේදයන් නොමැති වීම ගැටලුවකි. දඹුලු විහාරයේ උරුමය ආරක්‍ෂා කිරිම සඳහා බැඳි සිටින ආයතන තම ආයතනයට සීමා වූ නීතිරීති මත පමණක් ක්‍රියාත්මක වේ. එසේ ක්‍රියාත්මක වීම උරුමය ආරක්‍ෂාකර ගැනීම උදෙසා ප්‍රමාණවත් නොවේ. දඹුලු ලෙන් විහාරය ආශ්‍රිතව තවත් සුවිශේෂි ගැටලුවක් වන්නේ නරඹන්නා කළමනාකරණය නොකිරිමයි. ඔවුන් ඡායාරූප ගැනීම සිතුවම් හා ප්‍රතිමා ස්පර්ශ කිරිම නිරන්තරයෙන් සිදු කරයි. එයින් සිතුවම්වලට දැඩි බලපෑමක් ඇති කරයි. දෙස් විදෙස් සංචාරකයින්ට එම ඓතිහාසික ස්ථානය පිළිබඳව දැනුවත් නොකිරීම මර්ග උපදේශකයින්ට ද මානා අවබෝධයක් නොමැතිකම ගැටලුවක් බවට පත්වී ඇත. පුරාවිද්‍යාත්මක උරුමයට අභියෝගයක් ඇති කරන ප්‍රධානතම හේතු සාධකය වී ඇත්තේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමයි. නිසි ලෙස එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දඹුලු රජමහා විහාරයේ උරුමය විනාශ වීමට ඍජුව බලපා ඇත. දඹුලු විහාරයේ උරුම සංරක්‍ෂණයේ දී මුහුණ පෑමට සිදුවී ඇති තවත් ගැටලුවක් වන්නේ දේශපාලනික, ආගමික,සමාජීය බලපෑමයි. මේ ගැටලුවල ස්වභාව අනුව අපහසුතාවයට ලක්වන්නෙ සංචාරකයාය.

උරුමය පිළිබඳව අවබෝධයක් නොමැති වීම තුලින් ද ගැටලු මතු වී ඇත. ඒ අනුව බැම්මත වාඩිවීම,චිත්‍ර හා ප්‍රතිමා ස්පර්ශ කිරීම හේතුවෙන් උරුමය පරිහානියට පත්වන්නේය. ලෙන් විහාරවල දක්නට ලැබෙන සිතුවම් මානව හා සත්ව පලිබෝධයන්වලට ලක්වී හායනයට පත් වෙමින් පවති. ඇතැම් ලෙන් විහාරවලට මෙම තත්වය බලපා තිබේ. උරුමය පවත්වා ගැනීමට සංචාරකයා ප්‍රබල සාධකයක් වේ. එ බැවින් අවශ්‍ය යටිතල පහාසුකම් සලස්වා දිය යුතුය. නිරන්තරයෙන් දෙස් විදෙස් සංචාරකයින් මෙම පුද බිම නැරඹීමට පැමිණෙ. ප්‍රමානවත් යටිතල පහසුකම් නොතිබීම ගැටලුවක් වී ඇත. මෙ වැනි උරුම

සංරක්ෂණ ගැටලු පිළිබඳව අවධානය යොමු කොට ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව අවධානය යොමු කරලීමට අපේක්ෂිතය.

## සමාලෝචනය

දඹුලු රජමහා විහාරය ශ්‍රී ලාංකික සංස්කෘතික ත්‍රිකෝණයට අයත් වන පුදබිමකි. එහි ඇති බෞද්ධ උරුමය පිළිබඳව සැලකිල්ලට ගෙන 1991 දී ලෝක උරුමයක් ලෙස නම් කරණ ලදී. වර්තමානය වනවිට එය යම් මට්ටමකින් පරිහානියට පත්ව ඇත. බෞද්ධ සිතුවම් හා නොයෙක් සංස්කෘතික උරුමන් පිරි කලාගාරයක් ලෙස නම් කල හැකිය. එ වැනි අගනා උරුමයන් පිළිබඳව ගවේෂණාත්මක අධ්‍යයනයක නිරතව සමාජගත කොට උරුමය රැකීම ඉතාමත් වැදගත්ය.

ප්‍රමුඛ පද : ඓතිහාසික දඹුලු විහාරය, උරුම සන්දර්භය, වර්තමාන උරුම සංරක්ෂණ ගැටලු, යෝජනා

## ආශ්‍රිත ග්‍රන්ථ

ගුණවර්ධන ප්‍රිශාන්ත. (2010). ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ සංඝාරාමය, ජා ඇලː සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ඉලංගසිංහ. එම්. ( 1994 ). දඹුලු විහාරය, කැළණියː එම්පවර් මුද්‍රණාලය.

විජයවර්ධන කුසුම්සිරි. ( 2014 ). රජමහා විහාර, මරදානː දයාවංශ ජයකොඩි සහ සමාගම.

Basanayake.H.T. (1988).Dambulla project first Archaeological Excavation and Research Report central cultural fund Colombo.

Paranavitana.S. (1970).*The Inscription of Ceylon*.vol .1 Department of Archaeology.